# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,243 - 2021 අගෝස්තු මස 27 වැනි සිකුරාදා - 2021.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | -- |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1244 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | -- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 සැප්තැම්බර් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1243 - B 082264— 5,403 (2021/08)
F 1 -

# අතුරු ව්‍යවස්ථා

**කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

**කුරුණෑගල මහා නගර සභාව**

252 වන අධිකාරය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 272 (15) උපවගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර කුරුණෑගල මහා නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2020.07.16 දින පැවති එකී මහා නගර සභාවේ අංක GC-6(19)-2020.07.16 දරන යෝජනාවෙන් සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයේ දැක්වෙන කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර වයඹ පළාතේ ආණ්ඩුකාරවර රාජා කොල්ලුරේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රාජා කොල්ලුරේ,
ආණ්ඩුකාරවර, වයඹ පළාත.

2021 ජුනි මස 10 වැනි දින,
කුරුණෑගල දී ය.

**කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන.

1. මහා නගර සභා ආඥාපනතේ 267 (1) වගන්තිය සමග කියවිය යුතු 272 (15) උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

විෂයය සහ අරමුණු.

2. බල ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුඛ විහරණය පහසුව හා සුභ සාධනය සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීම යටතේ අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම ගාස්තු අයකිරීම හා පාලනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවේ අන්තර්ගතය වේ.

අතුරු ව්‍යවස්ථාවේ නාමය.

3. කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම් විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඉටුකළ යුතු කාර්යය.

4. කවර පුද්ගලයෙකු හට හෝ මහා නගර සභාව විසින් සම්මත කරන ලද යෝජනාවක දක්වා ඇති සහ නිසි ලෙස *ගැසට් පත්‍රයකින්* ප්‍රසිද්ධියට පත්කරන ලද අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන වලංගු බලපත්‍රයක් ලබාගත යුතු ය.

5. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කවර වූ හෝ අප්‍රසන්න ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ දී අපේක්ෂිත ගොඩනැගිලි හෝ පරිශ්‍රය පහත කොන්දේසි සපුරා තිබිය යුතු ය.

(i) තත්කාලයේ බල පවත්නා නීතීන්ට අනුකූලව මහා නගර සභාවේ සැලසුම් කමිටුව විසින් අනුමත කරන ලද සැලසුමකට අනුව ශක්තිමත් වූ හා අපේක්ෂිත ප්‍රමාණයේ පාරිභෝගිකයන්ට පහසුකම් සලසා දිය හැකි ප්‍රමාණවත් ඉඩකඩ සහිත වූ හා අවදානම් හා හානි රහිත එකක් විය යුතුය ;

(ii) තත්කාලයේ බල පවත්නා නීතීන්ට අනුකූලව සෑම කොටසකම පිහිටි කාමරවල බිත්ති සුදුසු ද්‍රව්‍යයකින් මීටර් 2.14ට වඩා නොඅඩු උසකින් ඉදි කළ යුතු අතර එම බිත්තිවල ඇතුළත පැත්තේ අවම වශයෙන් පහළ මීටර් දෙකක් සිමෙන්ති යොදා කපරාදු කර ඔප දමා හෝ පිඟන් ගඩොල් ඇල්ලීම කර තැබිය යුතු අතර ඇතුළත පැත්තේ ඉතිරි කොටස හුණු ගා තිබීම ප්‍රමාණවත් වේ.

(iii) මහා නගර සභාව විසින් කලින් කලට නියම කරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි කාණු පද්ධතියකින් මුළු පරිශ්‍රයම සමන්විත විය යුතු ය.

(iv) මහා නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ පිළිවෙලට අනුකූල වන ලෙස ආරම්භයේ සිටම අපද්‍රව්‍ය වෙන් කිරීමේ කාර්යය පහසු කරවනු පිණිස සනීපාරක්ෂක කැළි කසල එකතු කිරීමේ බඳුන් පරිශ්‍රය වෙත සපයා ගෙන තිබිය යුතු අතර මහා නගර සභාව විසින් කලින් කලට නියම කරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් පරිශ්‍රය තුළ සපයා තිබිය යුතු ය.

(v) මහා නගර සභාවේ නිර්දේශය කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව ගිනි ආරක්ෂණ උපකරණ හෝ ගිනි ආරක්ෂා ක්‍රමවේදයක් සපුරාලිය යුතු ය.

(vi) ඉහත සඳහන් කොන්දේසි සපුරා ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය ලබාගෙන තිබිය යුතු ය.

6. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම පහත දක්වෙන කරුණු සපුරාලිය යුතුය.

(i) සෑම බලපත්‍රලාභියෙකු විසින්ම තම ව්‍යාපාරය කරගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය කිසිදු දුර්ගන්ධයක් හෝ වෙනයම් වූ පීඩාවක් ඇතිවීම වළක්වන්නා වූ ආකාරයකින් ගබඩා කළ යුතුය.

(ii) කවර වූ හෝ පීඩාවක් හෝ දුර්ගන්ධයක් ඇතිකළ හැකි ද්‍රව්‍ය පොදු ස්ථානයක් හෝ මහා මාර්ග යක් හරහා ප්‍රවාහනය කරනවිට ඒවා මගින් පොදු ජනතාවට කිසිදු පීඩාවක් හෝ දුර්ගන්ධයක් ඇති නොවනු පිණිස ඒවා ආවරණිත සහ තෙතමනය කාන්දු නොවන්නා වූ බහාලුම්වල බහා ප්‍රවාහනය කළ යුතු ය.

(iii) සෑම බලපත්‍රලාභියකු විසින්ම කවර වූ හෝ නිෂ්පාදන ක්‍රියාවලියක දී පිට කෙරෙන්නා වූ කවර වූ හෝ අප්‍රසන්න වාෂ්ප හෝ වායු හානිකර හෝ අප්‍රසන්න ප්‍රතිඵල ඇති නොවන ලෙස ඒවා විසිරී යන තරම් වූ ආකාරයේ උසකට මුදාහැරීම හෝ නාගරික ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය ප්‍රකාර කෙලින්ම ගින්නක් හරහා යැවීම හෝ සනීකරණ උපකරණයක් තුළට යැවීම සිදුකළ යුතුය.

(iv) සෑම බලපත්‍රලාභියකු විසින්ම අදාළ ව්‍යාපාරය සිදු කරන්නා වූ පරිශ්‍රය සඳහා ප්‍රමාණවත් කානු පද්ධතියක් සකසා පිරිසිදු කිරීමට වගබලා ගත යුතු ය. තව ද, එකී කානු පද්ධතිය සහ ව්‍යාපාරය කරගෙන යන්නා වූ පරිශ්‍රයේ බිම නිසි පරිදි නඩත්තු කරමින් පිරිසිදුව තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

(v) සෑම බලපත්‍රලාභියකු විසින්ම ව්‍යාපාරය කරගෙන යන්නා වූ පරිශ්‍රයේ බිත්ති, කැලිකසල උරාගැනීම වලකන ආකාරයට යහපත් තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර ඒවා වාර්ෂිකව පින්තාරු කළ යුතු ය.

(vi) සෑම බලපත්‍රලාභියෙකු විසින්ම අදාළ ව්‍යාපාරය හා සම්බන්ධ උපකරණ හා භාජන පිරිසිදුව තබා ගත යුතු අතර දිනපතා පිරිසිදු කරවීමට වග බලාගත යුතුය.

(vii) සෑම බලපත්‍රලාභියකු විසින්ම අපද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන සමඟින් සියලු ඉවතලන ද්‍රව්‍ය, අතුගා ඉවතලන දේ හා සීරීමෙන් ඉතිරි වූ කොටස්, එම පරිශ්‍රයේම තවදුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම නොයොදවන්නේ නම්, දිනපතා ආවරණිත බහාලුම්වල බහා බැහැර කරවිය යුතු ය.

(viii) සෑම බලපත්‍රලාභියකු විසින්ම ව්‍යාපාර කාර්යයන් සඳහා භාවිතා කර බැහැර කරනු ලබන ජලය තත්කාලීන බල පවත්නා නීතිරීතිවලට ජලය ක්‍රමානුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතුය.

7. බලපත්‍රලත් පරිශ්‍රය තුළට පැමිණෙන මහජනතාවට සහ පාරිභෝගිකයන්ට කියවිය හැකි ප්‍රමාණයට ව්‍යාපාර බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු ය.

8. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම තම ව්‍යාපාර ස්වභාවයට අදාළ වන පරිදි තම සේවකයන් සඳහා ආරක්ෂිත ඇඳුම් උපකරණ මෙවලම් සපයා දීම සහ භාවිතා කරවීමට සහ එසේ වන බවට බලපත්‍රලාභියා වගබලා ගත යුතු ය.

නොකළ යුතු කාර්යයන්.

9. නාගරික කොමසාරිස්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු වේනම් මිස කිසිම තැනැත්තකු මහා නගර සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පවත්වාගෙන යාම නොකල යුතු ය.

10. කිසිදු බලපත්‍රලාභියෙකු විසින් හෝ කිසිදු ගංගාවක්, ප්‍රවාහයක්, කැපූ ඇළ දිය මාර්ගයක්, දිය දොරක්, ළිඳක, වැවක්, ඇළ මාර්ගයක්, කවර හෝ ජල ධාරාවක් තුළට කවර හෝ කිලිටි දුර්ගන්ධයම හෝ අපවිත්‍ර ජලය හෝ අනෙකුත් ද්‍රාවණයන් ගැලීමට සැලැස්වීමෙන් හෝ මුදා හැරීමෙන් හෝ යම් අපවිත්‍ර ද්‍රව්‍යයක් එහිලා සේදීමෙන් හෝ අන් කවර වූ හෝ ආකාරයකින් එකී ගංගාව ජල ප්‍රවාහය, කැපූ ඇළ දිය මාර්ගය, දිය දොර, ළිඳ, වැව, ඇළ මාර්ගය, ජල ධාරාව දූෂණය හෝ අපවිත්‍ර කිරීම නොකළ යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයේ දක්වා ඇති ව්‍යාපාරයට අමතරව මහා නගර සභාවෙන් අදාළ ව්‍යාපාරය සඳහා වෙන් වශයෙන් බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව වෙනත් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

12. එම ව්‍යාපාරයේ සේවය කරනු ලබන සේවකයෙකු බෝවන හෝ ආසාදිත රෝගයකින් පෙලෙන අයකු හෝ එසේ ආසාදිත හෝ බෝවන රෝගයකින් පෙලෙන අයෙකුට බීජෞෂණ කාලය තුළ උපස්ථාන කරමින් සිටි අයකු නොවිය යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය.

13. මෙහි පළමුවන, දෙවන, තුන්වන උපලේඛනගත ව්‍යාපාරවලට අමතරව කළින් කළට හඳුනාගන්නා ව්‍යාපාර ගැසට් කරනු ලබන වෙළෙඳාම් අප්‍රසන්න, අන්තරාදායක, අප්‍රසන්න සහ අන්තරාදායක වශයෙන් නිශ්චිතව සඳහන් කර මහා නගර සභාවේ යෝජනා සම්මුතියකින් ප්‍රකාශයට පත් කිරීම මහා නගර සභාවේ කාර්ය භාරයක් වන්නේ ය.

අභිමතය/අත්හැරීම්/ නිදහස් කිරීම්.

14. අතුරු ව්‍යවස්ථාවේ වගන්තියක් කඩවීම මහා නගර සභාව විසින් එය නිවැරදි කරලීමට දන්වන කාලය දීර්ඝ කළ හැක්කේ, බලපත්‍රලාභියා විසින් කරනු ලබන පිළිගත හැකි සාධාරණ ලිඛිත ඉල්ලීමක් අනුව නාගරික කොමසාරිස්වරයා විසින් ය. එම කාලය දින 14ක් නොඉක්මවිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු.

15. මහා නගර සභා ආඥාපනත යටතේ සාදන ලද මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කර ඇති වෙළෙඳාම් සඳහා යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය දෙමින් මහා නගර සභාව විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මහා නගර සභා ආඥාපනතේ 247 (අ) වන වගන්තිය යටතේ ගාස්තුවක් අය කිරීමට බලය ඇති අතර එකී ගාස්තුව 247 වගන්තිය යටතේ දක්වා ඇති උපරිමයන් නොඉක්මුනු බලපත්‍ර ගාස්තු අයකිරීමට මහා නගර සභාවට බලය ඇත.

බලපත්‍රයේ වලංගු කාලය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධි විධාන මගින් කල් පිරීමට පෙර අවලංගු නොකරන්නේ නම් එම බලපත්‍රයේ නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වලංගු වේ.

පරීක්ෂණ, අධීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පරීක්ෂා කිරීමේ හා අධීක්ෂණය කිරීමේ බලධාරියා මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු වේ.

18. පරීක්ෂා කිරීමේ ක්‍රියා පටිපාටිය සහ පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය සහ මෙහෙයුම් අධීක්ෂණය මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන අතර ඒ සඳහා බලපත්‍රලාභියා අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුය.

19. අතුරු ව්‍යවස්ථාවක් හෝ අතුරු ව්‍යවස්ථාවන් උල්ලංඝනය හෝ කඩකිරීම සිදුවන ඕනෑම අවස්ථාවක දී, නගරාධිපතිවරයාට හෝ අදාළ බලධාරීන්ට, ලිඛිතව හෝ වාචිකව ඕනෑම අවස්ථාවකදී වාර්තා කිරීම හෝ පැමිණිලි කිරීම ඕනෑම පුරවැසියකුට හෝ පාරිභෝගිකයකුහට සිදුකළ හැකිය. එවන් සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම අදාළ බලධාරීන් පරීක්ෂා කර බැලිය යුතු අතර පැමිණිලිකරුට වැඩ කරන දින 14ක් ඇතුළත වාර්තා කළ යුතු ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධි විධානයන් එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් වූ කවර හෝ විධි විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳව වූ කිසියම් වරදක් සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 267(3) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. දඩ හා දණ්ඩන.

22. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි ඇතුළත් වන පද සම්බන්ධයෙන් වෙනත් අයුරකින් අර්ථයක් අපේක්ෂා නොකරන්නේ නම්, අර්ථ නිරූපනය හා නිර්වචන.

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, විශේෂිත කාර්යයන් සඳහා මහා නගර සභාව විසින් හෝ නගරාධිපතිවරයා සහ/හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ලිඛිතව බලය පවරන ලද කවර හෝ නිලධාරියකු ද,

''නගරාධිපති'' යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා ද,

''බලපත්‍රලාභියා'' යන්නෙන් මෙහි දක්වා ඇති කවර හෝ අතුරු ව්‍යවස්ථාවක විධිවිධානවලට යටත්ව බලපත්‍රයක් ලබාගෙන ඇති සහ එවන් පරිශ්‍රයක් සඳහා භාරකරුවකු හෝ කළමණාකරුවකු සිටින හෝ කාලානුරූපව එවන් පරිශ්‍රයක් පාලනය කරනු ලබන පුද්ගලයෙකු සිටින අයෙකු ද,

''බලපත්‍රලාභී පරිශ්‍රය'' යන්නෙන් මෙහි දක්වා ඇති අතුරු ව්‍යවස්ථා විධිවිධාන යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇති පරිශ්‍රය ද,

''පොදු ස්ථාන'' යන්නෙන් කවර හෝ මාර්ගයක්, ප්‍රවේශ මාර්ගයක්, වීදියක්, පටු මඟක්, පදික වේදිකාවක්, පොදු ක්‍රීඩාංගනයක්, මාර්ග අවශේෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම්පලක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇළ මාර්ගයක්, ටැංකියක්, පොකුණක්, වාරිමාර්ගයක්, වැසි දිය නලයක්, ආයතනයට අයත් කවර හෝ ඉඩමක්, පොදු පරිභෝජනය සඳහා වෙන් කරන ලද කවර හෝ රජයේ ඉඩම් කට්ටියක් හෝ මහජනයා විසින් භාවිතා කරනු ලබන වෙනත් කවර හෝ පොදු ස්ථානයක් ද,

''නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා'' යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා ද,

''සභාව'' යන්නෙන් කුරුණෑගල මහා නගර සභාව ද,

''මහා නගර සභා බල ප්‍රදේශය'' යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ බලය පවත්නා ප්‍රදේශය ද අදහස් කෙරේ.

''සැලසුම් කමිටුව'' යන්නෙන් කුරුණෑගල මහා නගර සභාවේ සැලසුම් කමිටුව යනුවෙන් ද,

''සුදුසු ද්‍රව්‍ය'' යන්නෙන් ගඩොල්, කබොක්, කළුගල්, සිමෙන්ති ගල්, කොන්ක්‍රීට් යන ද්‍රව්‍ය අදහස් කෙරේ.

### 1 වන උපලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර

1. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම
3. සම් පදම් කිරීම
4. සම් විකිණීමට තබා ගැනීම
5. සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
6. උම්බලකඩ නිෂ්පාදනය
7. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම
8. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
9. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම
10. කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
11. මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම

12. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම
13. දුම්කොළ වියළීම
14. සත්ව ආහාර නිපදවීම
15. පුන්නක්කු නිපදවීම
16. සත්ව මාංශ හෝ ලේ පැසවීම
17. සබන් නිෂ්පාදනය කිරීම
18. සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම
19. ට්‍රන්ක් පෙට්ටි සෑදීම
20. අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම
21. ලෝහ සුන්බුන් තබා ගැනීම
22. ගෘහ භාණ්ඩ නිපදවීම
23. වේවැල් භාණ්ඩ නිපදවීම
24. වඩු කර්මාන්තශාලාවක් පැවැත්වීම
25. සිරප් හෝ පළතුරු බීම නිපදවීම
26. රසකැවිලි නිපදවීම
27. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
28. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
29. දත් බුරුසු නිපදවීම
30. රා එකතු කිරීම
31. විනාකිරි නිපදවීම
32. දැව ඉරීම
33. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම
34. සෝඩා නිපදවීම
35. කෙඳි සායම් කිරීම
36. සම් භාණ්ඩ නිපදවීම
37. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
38. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම
39. බේකින් පවුඩර් නිපදවීම
40. ගෑස් මැන්ටල් නිපදවීම
41. පොටි නිපදවීම
42. ඉටිපන්දම් නිපදවීම
43. කපුරු නිපදවීම
44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
45. රෙදි සෝදන නිල් නිපදවීම
46. ලාකඩ නිපදවීම
47. සුවඳ විලවුන් නිපදවීම
48. පාසැල් රටහුණු නිපදවීම
49. ටයර් හෝ ටියුබ් නිපදවීම
50. ටයර් නැවත පිරවීම
51. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම
52. සිමෙන්ති නිපදවීම
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
54. වැලි කඩදාසි නිපදවීම
55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
56. ගඩොල් පිළිස්සීම
57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම
59. උළු නිපදවීම
60. පොහොර හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කිරීම
61. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම

## 2 වන උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර

1. කළුගල් කැණීම හෝ කැඩීම
2. එළවළු තෙල් නිෂ්පාදනය
3. පොල්තෙල් නිෂ්පාදනය
4. ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
5. මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය
6. තේ පෙට්ටි නිපදවීම
7. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම
8. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය
9. පිදුරු තබා ගැනීම
10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
11. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම
12. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
13. හිරිගල් හෝ හුණුගල් කැණීම
14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම
15. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම
16. පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම
17. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම
18. විසිරි පින්තාරු කිරීම
19. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම
20. ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)

## 3 වන උපලේඛනය - අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර

1. තලාතු මිනිරන් සුද්ද කිරීම
2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි සකස් කිරීම
3. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම
5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
6. තෙල් හෝ සත්ව මේද නිපදවීම
7. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම
8. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම
9. මෝරතෙල් සකස් කිරීම
10. බෝට්ටු තැනීම
11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
12. ලෝහ වර්ග පැස්සවීම
13. මෝටර් වාහන අළුත්වැඩියා කිරීම
14. මෝටර් වාහන සේවා කිරීම
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
17. මෝටර් වාහන බෝඩි තැනීම
18. කෘමිනාශක, දිලීර නාශක, පැලෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම
19. විෂබීජ නාශක නිපදවීම හා මදුරු දඟර නිපදවීම
20. මදුරු දඟර නිපදවීම

08-432

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.